# Dinesh D. Dodamgoda

**Attorney-at-Law, M.Sc.(Cranfield, UK)**
**Former Member of Parliament**

#55/32, 1st Lane, Gemunu Mawatha, Sri Subhuthipura, Battaramulla, Sri Lanka.
Mobile: **(+94) 71 7778 667**
Email: **dodamgoda@gmail.com**


මාගේ අංකය: **CCD/1/25**
**2025-05-20** දින.

**අධ්‍යක්ෂක,**
**කොළඹ අපරාධ කොට්ඨාශය,**
**දෙමටගොඩ.**

අධ්‍යක්ෂතුමනි,

**විමර්ශනයක් සඳහා මාගේ ජංගම දුරකථනය භාර දෙන ලෙස කළ ඉල්ලීම සම්බන්ධවයි.**

ඉකුත් 17 වෙනි සෙනසුරාදා රාත්‍රී, මා, මාගේ සේවාදායක තුසිත හල්ලොලුව මහතා සමග ජනාධිපති නීතිඥ නීති උපදේශන සේවාවකට සහභාගීවී, නාරාහෙන්පිට වට රවුම පාරෙන් ආපසු පැමිණීමේදී අප ගමන් කළ රථයට වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් පැවැත්වෙන විමර්ශනය සඳහා මාගේ ජංගම දුරකථනය ලබා දෙන ලෙස ඔබ විසින් ඊයේ (19) දින මා වෙත වාචිකව දැනුම් දෙන ලදී.

මා වෘත්තියෙන් නීතිඥයෙකු වන අතර, මාගේ සියළු සේවාදායක ලිපි ගොනු විස්තරද එම දුරකථනයේ ගබඩා වී ඇති බැවින්, නීතිඥවරයෙකු ලෙස මාගේ වෘත්තීමය වගකීම සහ අයිතිය අනුව (The lawyer-client relationship) එකී තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම මගේ වගකීමකි, අයිතියකි.

ඒ කෙසේවෙතත්, එකී තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා වන සහ ඒ බව මාහටත් සහතික වන පරිදි සහ මා විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කිරීමට නියමිත නඩුකරය විසින් නියම කරන මගපෙන්වීම් අනුව කටයුතු කිරීමට මම බැඳී සිටිමි. ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීරණයක් අනුව මගේ දුරකථනය ඔබේ විමර්ශනය සඳහා ලබා දීමට මම බැඳී සිටිමි.

එසේම, ඔබ විමර්ශනයට අදාල කරුණු සම්බන්ධයෙන් මා සම්බන්ධ වූ කාලයට අදාලව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දෙන සීමා මායිම් පිළිබඳ මග පෙන්වීම් අනුව පමණක් මාගේ දුරකථන පරීක්ෂාවට ඉඩ ලබා දෙන බවද දන්වනු කැමැත්තෙමි.

එසේම, ඔබ විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය ලබා ගැනීමට අයැදුම් කරද්දී, මෙම ලිපිය අමුණා එම අයැදුම සමග ඉදිරිපත් කරන මෙන්ද දන්වනු කැමැත්තෙමි.

ස්තුතියි.
මෙයට,

Dinesh D. Dodamgoda
Attorney-at-Law
Notary Public, Commissioner for Oaths,
Company Secretary,
#55/32, 1st Lane, Gemunu Mawatha,
Sri Subhuthipura, Battaramulla.

දිනේෂ් දොඩම්ගොඩ
නීතිඥ

**පිටපත්:**

1. නීතිඥ රජීව් අමරසූරිය මහතා, සභාපති, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, 153, මිහිඳු මාවත, කොළඹ 12. (දැන ගැනීමට සහ සුදුසු පියවර ගැනීම පිණිස)
2. ලේඛකාධිකාරී, ශ්‍රී ලංකාවේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණය, අළුත් කඩේ වීදිය, කොළඹ 12. (දැනගැනීම පිණිස)

3. නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතා, පොලිස්පති, පොලිස් මූලස්ථානය, කොළඹ 2. (අවධානය පිණිස)
4. ස්ථානාධිපති, ඒකක 4, කොළඹ අපරාධ කොට්ඨාශය, 185, කොලොන්නාව පාර, කොළඹ 9. (දැනගැනීම පිණිස)
5. Jaime Carey, President, International Bar Association, Chancery House, 53-64 Chancery Lane, London, WC2A 1QS, United Kingdom. (For your attention)
6. මාධ්‍ය වෙත (මාධ්‍ය වෙත දැන ගැනීම පිණිස මෙම ලිපිය නිකුත් කරමි.)